# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

# පශ්චාද් උපාධි නිර්ණායක

## බෞද්ධ අධ්‍යයන පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව

01. **SLQF 08 - 25 Credits**

02. **ලියාපදිංචිය සඳහා සුදුසුකම්**

- අවම වශයෙන් කවර හෝ විෂයධාරාවකින් ප්‍රථම උපාධියක් ලබා තිබීම

**හෝ**

- ඊට සමාන යැයි විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මගින් පිළිගන්නා සුදුසුකම් සපුරා තිබීම.

03. **පාඨමාලා ව්‍යුහය**

- ඒකක 06ක් ඇතුළත් වේ. එක් විෂය ඒකකයට දේශන පැය 45කි. සතියකට පැය 06 බැගින් සති 36ක කාලයක් සති අන්ත පාඨමාලාවක් ලෙස පැවැත්වේ. මෙයට අමතර ව විස්තාරිත රචනය අනිවාර්ය විෂය ඒකකයකි.

| | | | |
|---|---|---|---|
| 01. | බුදුසමයේ මූලික ඉගැන්වීම් | - | PGBS 81013 |
| 02. | බෞද්ධ සමාජ දර්ශනය | - | PGBS 81023 |
| 03. | බෞද්ධ සංස්කෘතියේ නූතන ප්‍රවණතා | - | PGBS 81033 |
| 04. | මහායාන බුදුසමය - මූලධර්ම | - | PGBS 81043 |
| 05. | බුදුදහම හා සමාජ ගැටලු | - | PGBS 81053 |
| 06. | විස්තාරිත රචනය | - | PGBS 8106X |

04. **විභාග නිර්ණායක**

- අපේක්ෂකයන් පැය 03ක ලිඛිත ප්‍රශ්න පත්‍ර 05කට පෙනී සිටිය යුතු අතර පශ්චාද් උපාධි ඩිප්ලෝමාව ප්‍රදානය කිරීම පිණිස විස්තාරිත රචනය සඳහා ද සාමර්ථ්‍යය ලබා ගත යුතුය.
- විස්තාරිත රචනය භාර දීම සඳහා දෙනු ලබන උපරිම කාලසීමාව ලියාපදිංචි වූ දිනයේ සිට වසර 02කි.
- විස්තාරිත රචනය උපරිම වචන සංඛ්‍යාව 5000 නොඅඩු විය යුතු ය.

05. **අධ්‍යයන කාලසීමාව**

- ඉගැන්වීම් කාලසීමාව සති 36කි.
- සෑම විෂය පත්‍රයකට ම එක් පැවරුමක් සඳහා පැය 05ක අධ්‍යයන කාලයක් බැගින් වෙන් කළ යුතු ය. උපදෙස් ලබා දීම වෙනුවෙන් පැය 01ක් හා පුස්තකාල පරිහරණය සඳහා ද පැයක් වෙන් කළ යුතු ය.
- සෑම පැවරුමක් ම අදාළ මාතෘකාව ලබා දුන් දිනයේ සිට මාස දෙකක් ඇතුළත නිමා කර භාර දිය යුතු ය.

## 06. විස්තාරිත රචනය

බෞද්ධ අධ්‍යයන පශ්චාද් උපාධි ඩිප්ලෝමාව හදාරන විද්‍යාර්ථීන් අනිවාර්යයෙන් ම සිය පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සම්පූර්ණ කිරීම සඳහා විස්තාරිත රචනයක් සම්පූර්ණ කළ යුතු ය. එය වචන 5000කට නොඅඩු විය යුතු ය.

### I මාතෘකාව තෝරා ගැනීම :

බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළ මාතෘකාවක් තෝරා ගත යුතු ය. එම මාතෘකාව තෝරා ගැනීමේ දී පුළුල් පරාසයක් පුරා විහිදුණ මාතෘකාවක් තෝරා ගැනීමෙන් වැළකී සිටීම වැදගත් ය.

පාඨමාලාව ආරම්භ වී සති 08ක් ඇතුළත පර්යේෂණ මාතෘකාව භාර දීම අනිවාර්ය වේ.

### II විස්තාරිත රචනයේ දළ සැලැස්ම සැකසීම :

බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළ මාතෘකාවක් තෝරා ගත යුතු ය. අනතුරු ව විස්තාරිත රචනයේ අධ්‍යයන පසුබිම, අධ්‍යයන ගැටලුව, අරමුණ, විෂය සීමාවන්, ක්‍රමවේදය, පරිච්ඡේද, නිගමනය, ග්‍රන්ථ නාමාවලිය ආදිය ඇතුළත් ව දළ සැලැස්මක් ඉදිරිපත් කළ යුතු ය. මෙය පිටපත් තුනකින් ලබා දිය යුතුය. එහි ලා උපදේශකවරයෙකුගේ සහාය ලැබෙනු ඇත.

### III විස්තාරිත රචනයේ දළ සැලැස්ම ඉදිරිපත් කිරීම හා අනුමැතිය ලබා ගැනීම :

විස්තාරිත රචනයේ දළ සැලැස්ම අදාළ අධ්‍යයන වර්ෂය ආරම්භ වී **මාස 02ක් තුළ** ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානයට භාර දිය යුතු ය. අදාළ පීඨයේ/අධ්‍යයන මණ්ඩලයේ අනුමත වූ පසු ඒ බව අපේක්ෂකයාට දැනුම් දෙනු ලැබේ.

## 07. ලියාපදිංචි කාලය දීර්ඝ කිරීම

සනාතන සභාව පිළිගනු ලබන හේතූන් මත ලියාපදිංචි කාලය දීර්ඝ කර ගත හැකි ය. එසේ වුව ද ලියාපදිංචි වූ වසරේ සිට වසර 03ක් තුළ පාඨමාලාවේ සියලු අවශ්‍යතා සම්පූර්ණ කළ යුතු යි.

2017.01.01 දින සිට ලියාපදිංචි වන විද්‍යාර්ථීන් සඳහා මෙම නිර්ණායක ක්‍රියාත්මක වේ.